දිවි තොර කරගැනීම් වාර්තා කිරීමේදී, ඒ පිටුපස ඇති සංකීර්ණ කරුණු පිළිබඳව සමාජය දැනුවත් කිරීමත්, අනුකාරක සිදුවීම් ඇති වීමේ අවදානම පහත හෙළීමත්, මාධ්‍ය අත රැඳි වගකීමක් ලෙසින් ගත හැක. එය කළ හැක්කේ, දිවි තොර කරගැනීම් වාර්තා කිරීම සඳහා හඳුන්වා දී ඇති මාධ්‍ය මාර්ගෝපදේශයන් පිළිපැදීම ඔස්සේයි.
කෙසේ නමුත්, තවමත් ඇතැම් මාධ්‍ය එම මාධ්‍ය මාර්ගෝපදේශයන්ට අනුගත වී නොමැති බව පෙනේ. අකුරැස්ස ප්‍රදේශයේ තරුණයෙකු දිවි තොර කරගැනීම ඔස්සේ මියගිය සිදුවීම, ලංකාදීප සහ දිවයින පුවත්පත් තුළ (ජන. 12, 2023) වාර්තා වී තිබූ ආකාරය ඊට නිදසුනකි.
දිවි තොර කරගැනීම් වාර්තා කිරීමේදී, දිවි තොර කරගත් අයගේ ඡායාරූප පළ කිරීම, දිවි තොර කරගත් අය ලියූ ලිපි වල කොටස් පළ කිරීම, හැඟීම් කළඹවන සුළු ලෙසින් දිවි තොර කරගැනීම් වාර්තා කිරීම මෙන්ම දිවි තොර කරගත් ආකාරය සඳහන් කිරීම වැනි දෙයින් වළකින ලෙසට මාධ්‍යවේදීන්ට උපදෙස් ලබාදෙන්නේ, ඒ ඔස්සේ අනුකාරක දිවි තොර කරගැනීම් සඳහා උත්ප්‍රේරකයක් ලැබිය හැකි බැවිණි. එසේම, එවැනි පුවත් වාර්තා සමඟ හදිසි උපකාරක අංක සඳහන් කිරීම ඔස්සේ, තවත් දිවි තොර කරගැනීම් වළක්වා ලීමට ඉඩක් ලැබෙනු ඇත.
වගකීම් සහගතව, ආචාර ධාර්මිකව දිවි තොර කරගැනීම් සම්බන්ධයෙන් වාර්තා කිරීම, දිවි තොර කරගැනීම් අවම කරගැනීමට මාධ්‍යයට ලබා දිය හැකි සමාජ දායකත්වය බවද, අපි මෙසේම සිහිපත් කරමු.
උපකාරක අංකයක් පළ කරමු, ජීවිතයක් රැකගනිමු!
හදිසි උපකාරක අංක:
*ශ්‍රී ලංකා සුමිත්‍රයෝ - 0707308308
*1333-CCCline
*ජාතික මානසික සෞඛ්‍ය ආයතනය-1926

